# රජයේ සහන පැකේජය

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| සංචාරක | මැතකදී එල්ල කරන ලද බලාපොරොත්තු නොවූ ත්‍රස්තවාදී ප්‍රහාරය සංචාරක ක්ෂේත්‍රය හා අදාල වෙනත් ක්ෂේත්‍ර වෙත හදිසි කම්පනයක් ඇති කිරීමට හේතු විය. මෙවැනි අවස්ථාවකදී කෙටි කාලීනව මෙම ක්ෂේත්‍ර වෙත ඇතිවන අහිතකර තත්වය නොවැළැක්විය හැකි නමුත් අදාළ ක්ෂේත්‍ර සඳහා ලබාදෙන බාහිර ප්‍රාග්ධන යෙදවීම් ක්‍රියාමාර්ගයන් මඟින් යථා තත්ත්වයට පත් කළ හැකිවේ. මෙම සිදුවීම්වල ඇති වැදගත්කම හා සමාජයේ බලපෑම පිළිබඳව සලකා බලා සංචාරක ක්ෂේත්‍රයට ඇති බලපෑම අවම කර ගැනීම පිණිස දැනට ලබා දී ඇති ණය සඳහා වසරක පමා සහන කාලයක් හා කාරක ප්‍රාග්ධන සහන පැකේජයක් රජය විසින් හඳුන්වා දී ඇත. | ආපසු ණය ගෙවීම සඳහා වන පමා සහන කාලයක් ප්‍රකාශයට පත් කිරීම. | ශ්‍රී ලංකා මහ බැංකුව | 08.05.2019 | 2020 මාර්තු 31 දක්වා සංචාරක ක්ෂේත්‍රය සඳහා ණය ආපසු ගෙවීම සඳහා වන පමා සහන කාලයක් ලබා දීමට සියලුම බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | | | ශ්‍රී ලංකා මහ බැංකුව | 21.05.2019 | බැංකු නොවන ආයතන සඳහා සංචාරක ක්ෂේත්‍රයට 2020 මාර්තු 31 දක්වා පමා සහන කාලයක් ලබා දීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | | | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 16.05.2019 | “එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා” වැඩසටහන යටතේ ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම වන “ ජය ඉසුර ” හා “ හරිත ණය ” සඳහා ද 2020 මාර්තු 31 දක්වා පමා සහන කාලයක් ලබා දෙන ලදි. එම පමා සහන කාලය තුළ දී අදාළ පොලී සහනාධාරය රජය විසින් දරණ බව සඳහන් කරමින් සියලුම බැංකු වෙත ලබා දි ඇති අදාළ මාර්ගොපදේශ සංශෝධනය කරන ලදී. |
| | | සහන පොලී අනුපාතයක් යටතේ නව කාරක ප්‍රාග්ධන ණය හඳුන්වා දීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 17.05.2019 | වාර්ෂික පිරිවැටුම මත පදනම්ව රු. මිලියන 250 ක උපරිම සීමාවක් සඳහා නව කාරක ප්‍රාග්ධන ණය නිකුත් කිරීමට සියලුම බැංකු වෙත නව මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කරන ලදී. මෙහි ණය අපසු ගෙවීම් කාලය වසර 2 ක් වන අතර එහි වාර්ෂික පොලි අනුපාතය 3.46% කි. (75% ක පොලී සහනාධාරය රජය විසින් දරනු ලැබේ.) |
| | | ආරක්ෂක උපකරණ ලබා ගැනීම සඳහා බදු සහන ලබා දීම. | රාජ්‍ය මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 07.05.2019 | බදු රහිත පදනම මත ආරක්ෂක උපකරණ ආනයනය කිරිම සඳහා ගැසට් පත්‍රය නිකුත් කරන ලදී. (අතේ ගෙන යාහැකි ලෝහ අනාවරකය, පියමං ලෝහ අනාවරකය, ගමන් මලු පරීක්ෂා කිරීමේ එක්ස් කිරණ උපකරණ, වාහන ස්කෑන් කිරීමේ උපකරණ) |
| | | VAT බදු අඩු කිරීමක් ලබාදීම | රාජ්‍ය මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 21.05.2019 | ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි වූ හොටල්, සංචාරක සංවිධායන සඳහා එකතු කළ අගය මත බද්ද (VAT) 2019 මැයි 21 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරක කාල සීමාවක් සඳහා 5% සීමාවේ පවත්වාගෙන යාම. |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| | | සංචාරක ක්ෂේත්‍රයට අදාල රැකියාවන්හි නියුතු ක්ෂුද්‍ර ව්‍යාපාරිකයන්, ස්වයං රැකියා නියුක්තිකයන් හා අනිකුත් අනියම් ව්‍යාපාරිකයින්ගේ ජීවන තත්වය ශක්තිමත් කිරීම සඳහා “සංචාරක පොඩ්ඩො” නමින් ණය යෝජනා ක්‍රමයක් හදුන්වා දීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 27.05.2019 | “සංචාරක පොඩ්ඩෝ” - වසර 3 ක ණය ආපසු ගෙවිමේ කාල සීමාවක් සහිතව රු. 500,000/- ක උපරිමයක් දක්වා පොලී රහිත හා වසර 1 ක සහන කාලයක් සහිත ණය යෝජනා ක්‍රමය හඳුන්වා දීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකු වෙත නව මාර්ගොපදේශ සංග්‍රහයක් නිකුත් කරන ලදී. (100%ක පොලී සහනාධාරය රජය මගින් දරනු ලැබේ.) |
| | | පෞද්ගලික බස් හිමියන් සදහා පමා සහන කාල සීමාවක් ලබා දීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 27.05.2019 | 2019 අප්‍රේල් හා මැයි මාසයන්හි වාරිකයන් සඳහා පමා සහන කාල සීමාවක් ලබාදෙන ලෙස අදාළ බැංකු/කල් බදු සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| | | එළිමහන් සංගිත සංදර්ශන පවත්වන කණ්ඩායම්වල සමාජිකයින් විසින් ලබා ගත් ණය හා ලිසිං පහුසකම් සඳහා සහන කාලයක් ප්‍රකාශ කිරීම හා සහනදායී පොලී අනුපාතයක් යටතේ නව කාරක ප්‍රාග්ධන ණය ක්‍රමයක් හදුන්වා දීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | 01.06.2019 | 2019 ජුනි මස 1 වන දින සිට වසර දෙකක ආපසු ගෙවීමේ කාලයක් සහිතව සියයට 3.46 ක පොලී අනුපාතයක් යටතේ සහ උපරිම රු. 500,000/- දක්වා නව කාරක ප්‍රාග්ධනණය මුදලක් ලබා දීම සඳහා ලංකා බැංකුව වෙත මාර්ගෝපදේශ සංග්‍රහයක් නිකුත් කිරීම. (සියයට 75 ක පොලී සසහනාධාරය රජය විසින් දරනු ලැබේ) |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| ප්‍රවාහන | සුව පහසු හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහනය හා ආරක්ෂාකාරී පාසල් ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීම. | “සිටි රයිඩ්” සහ “මිනි ටැක්සි” නමින් වැනි සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | "සිටි රයිඩ්" - පවතින පරණ බස් රථය වෙනුවට සුඛෝපභෝගි බස් රථයක්/පත්ළ පහත් බස් (නැගීමට පහසු) රථයක් මිලට ගැනීමට කැමති පෞද්ගලික බස් රථ හිමියන් සහ ස්වකීය කාර්ය මණ්ඩලය වෙනුවෙන් වඩා සුවපහසු ප්‍රවාහන සේවවන් සැපයීමට අදහස් කරන පිළිගත් ආයතන අභිමුඛ සමාගම් සඳහා උපරිම ණය මුදල වන රු. මිලියන 10 ක් 3.46% ක වාර්ෂික ණය පොලී අනුපාතයක් යටතේ වසර පහකින් ගෙවා නිම වන ආකාරයට ලබා දෙනු ලබයි. (75% ක සහනදායී ණය පොලී අනුපාතය රජය විසින් දරනු ලබයි.) |
| | | | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | “මිනි ටැක්සි” - දැනට ධාවනය වන ත්‍රී රෝද රථ වෙනුවට කුඩා මෝටර් රථයක් / විද්‍යුත් ත්‍රී රෝද රථයක් මිල දී ගැනීම සඳහා කැමති ත්‍රී රෝද රථ හිමියන්ට මෙම ණය ලබා ගත හැක. උපරිම ණය මුදල වන රු. මිලියන 2.25 ක් 3.46% ක වාර්ෂික ණය පොලී අනුපාතයක් යටතේ වසර පහකින් ගෙවා නිම වන ආකාරයට ලබා දෙනු ලබයි. (75% ක සහනදායී ණය පොලී අනුපාතය රජය විසින් දරනු ලබයි) |
| නිවාස | විවිධ සමාජ කණ්ඩායම් සඳහා නිවාස අවශ්‍යතා සපුරා ලීම. | “හෝම් ස්විට් හෝම්”, “සිහින මාලිගා” වැනි සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජූනි 2019 | “හෝම් ස්විට් හෝම්” - පළමු නිවස මිලදී ගැනීම/ ඉදිකිරීමට බලාපොරොත්තු වන අළුත විවාහ වූ තරුණ තරුණියන්ට මෙන්ම රජයේ හෝ පෞද්ගලික අංශයේ වේතනලාභී පුද්ගලයන්ට පහත කාර්යන් සඳහා මේ යටතේ ණය පහසුකම් සපයනු ලැබේ.<br>• ජාතික සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම හෝ වෙනත් පෞද්ගලික නිවාස ඉදිකරන්නන් විසින් ඉදි කරනු ලබන නිවාස යෝජනා ක්‍රමයකින් නිවසක් මිල දී ගැනීමට<br>• පෞද්ගලික නිවාස ඉදිකරන්නන්ගෙන් තනි නිවසක් මිල දී ගැනීමට<br>• තනි නිවසක් හෝ නිවාස ඒකකයක් මිල දී ගැනීමට<br>• තම පදිංචිය සඳහා තම පළමු නිවස මිල දී ගැනීම සඳහා<br>උපරිම ණය මුදල රු මිලියන 10 ක් වන අතර වාර්ෂික පොලී අනුපාතය 6% කි. ණය ආපසු ගෙවිය යුතු කාලය අවුරුදු 25 ක් වන අතර ඉන් පළමු අවුරුදු 15 සඳහා (පොලී අනුපාතයෙන් 56.7% ක පොලී සහනාධාරය රජය විසින් දරනු ලැබේ.) |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| | | | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | අප්‍රේල් 2019 | “සිහින මාලිගා” - විදේශ රැකියා නියුක්ති කාර්යංශයේ ලියාපදිංචි වී දැනට විදේශ ගතව රැකියා කරන ශ්‍රී ලාංකික පුරවැසියන් සඳහා මෙම ණය යෝජනාක්‍රමය මඟින් ණය ලබාදෙනු ලැබේ. මෙම ණය පහත සඳහන් කටයුතු සඳහා ලබාගත හැක.<br>• නව නිවසක් ඉදි කිරීම.<br>• පවතින නිවස අලුත්වැඩියා කිරීම.<br>• දැනට පවතින නිවස ඉවත්කර නව නිවසක් ඉදිකිරීමට<br>• නව නිවසක් මිල දී ගැනීමට/ නිවාස සංවර්ධන යෝජනා ක්‍රමයක නිවාස ඒකකයක් මිල දී ගැනීම.<br>• ඉඩමක් මිලදී ගෙන නිවසක් ඉදිකිරීමට<br>• නිවසක් මිලදී ගෙන අලුත්වැඩියා කිරීම.<br>උපරිම ණය මුදල රු. මිලියන 10 ක් වන අතර වාර්ෂික පොලී අනුපාතය 3.46% කි. ණය ආපසු ගෙවිය යුතු කාලය අවුරුදු 15 ක් වන අතර සහන කාලය අවුරුදු 2 (රජය විසින් පොලී අනුපාතයෙන් 75% පොලී සහනාධාරය ලෙස දරනු ලැබේ.) |
| සමාජ සුභසාධනය | ආරක්ෂිත හා වඩා සුවදායී වැඩිහිටි හා ළමා රක්ෂණ සේවා සැපයීම. | “රැකවරණ” සහන ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | “රැකවරණ” - මේ යටතේ දිවා සුරැකුම් මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා හැකියාවක් ඇති පුද්ගලයකුට හෝ ආයතනයක් වෙත ණය ලබාගත හැකි වේ. එම මධ්‍යස්ථාන ළමා හා කාන්තා කටයුතු හා වියලි කලාප සංවර්ධන අමාත්‍යාංශයේ ජාතික මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතුය. මේ යටතේ රු. මිලියන 3.5 උපරිමයකට යටතේ ණය ලබාගත හැකි අතර ඒ සඳහා වර්ෂයකට 3.46% පොලියක් අයකරනු ඇත. එම ණය මුදල වසර 7 ගෙවා නිම කල හැකි අතර උපරිම සහන කාලය වසර 2 කි. (පොලියෙන් 75% රජය විසින් දරනු ලැබේ.) |
| | | | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | මේ යටතේ වැඩිහිටි සුරකුම් මධ්‍යස්ථාන අලුතින් ඉදි කිරීමට හෝ තිබෙන මධ්‍යස්ථානක් සංවර්ධනය කිරිමට අපේක්ෂා කරණු ලබන පෞද්ගලික අංශයේ ආයෝජකයින් වෙත සහන ණය ලබාදෙනු ලැබේ. මේ යටතේ උපරිමය රු. මිලියන 10 ක් දක්වා සහන ණය ලබාගත හැකි අතර ඒ සඳහා 3.46% වාර්ෂික පොලියක් අයකරණු ඇත. ආපසු ගෙවිමේ කාලය වසර 7 ක් වන අතර උපරිම සහන කාලය වසර 2 කි. (පොලියෙන් 75% රජය විසින් දරනු ලැබේ.) |
| අධ්‍යාපන | උසස් අධ්‍යාපනය සඳහා ඉඩප්‍රස්ථා පුළුල් කිරීම හා පූර්ව ළමාවිය සංවර්ධනය. | “My Future” සහනදායී ණය යෝජනා ක්‍රමය හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | “My Future” - ණය යෝජනා ක්‍රමය යටතේ උසස්පෙළ සමතුන් හෝ ජාතික වෘත්තීය නිපුණතා (NVQ) 5 හෝ 6 මට්ටම සපුරාගත් තරුණ තරුණියන් හට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උපාධි ලබා ගැනීම සඳහා උපරිම ණය මුදල වන රු. මිලියන 1.1 ක් පොලී රහිතව |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| | | | | | ලබා ගත හැක. ණය ආපසු ගෙවිය යුත්තේ වසර 12 කිනි. (100% ණය පොලිය රජය විසින් දරනු ලබයි.) |
| | | "සිගිති පාසල" සහන ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | මැයි 2019 | "සිගිති පාසල" - දැනට පවතින පෙර පාසල් අළුත්වැඩියා කිරීමට හෝ රජයේ ලියාපදිංචි වී පෙර පාසල් අළුතින් ආරම්භ කිරීමට කැමති ආයෝජකයින් හට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සලසනු ලැබේ. මේ යටතේ උපරිමය රු. මිලියන 2 ක් දක්වා ණය වසරකට 6.93% ක සහන පොලී අනුපාතයක යටතේ ලබා ගත හැකිය. මෙම ණය මුදල වසර 7 කින් ගෙවා නිම කළ හැකි අතර උපරිම සහන කාලය වසර 2 කි. (පොලියෙන් 75% ක් රජය විසින් දරනු ලැබේ.) |

# එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ක්‍රියාත්මක වැඩසටහන්

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| කෘෂිකාර්මික | කෘෂිකාර්මික ඵලදායිතාව හා යාන්ත්‍රිකරණය වැඩිදියුණු කිරීම. | "රන් අස්වැන්න" හා "ගොවි නවෝදා" සහන ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජුනි 2017 | "රන් අස්වැන්න" - මේ යටතේ ගොවීන් හා ගොවි සංවිධාන, මල් වගාකරුවන්, විසිතුරු මත්ස්‍ය වගාවේ නිරත ව්‍යවසහයකයින්, කෘෂි හා මත්ස්‍ය නිෂ්පාදන සැකසුම්කරුවන් වෙත ණය ලබා දෙන අතර, බහුදින යාත්‍රා හා සංචාරක ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් බෝට්ටු හා උපකරණ මිල දී ගැනීම සඳහා රජය ලබා දෙන උපරිම ණය මුදල රු. මිලියන 750 වන අතර ඒ සඳහා 6.93% ක වාර්ෂික පොලියක් අය කෙරේ. මෙම ණය වසර 7 ක් තුළ ගෙවා නිමකල යුතු අතර ඒ සඳහා වසරක සහන කාලයක් ලබා දෙනු ලැබේ . (පොලියෙන් 50% ක් රජය විසින් දරනු ලැබේ.) |
| | | | | | "ගොවි නවෝදා" - මේ යටතේ කුඩා පරිමාණ ගොවීන් හා ගොවි සංවිධාන වෙත තම වගා කටයුතු යාන්ත්‍රිකරණය කිරීම සඳහා ණය දෙනු ලැබේ. උපරිම ණය මුදල රු. 500,000/- ක් වන අතර ඒ සඳහා වාර්ෂිකව 3.46% ක වාර්ෂික පොලියක් අය කෙරේ. වසර 7 ක් තුළ මෙම ණය ගෙවා අවසන් කළ යුතු අතර ඒ සඳහා වසරක සහන කාලයක් ලබා දේ. (පොලියෙන් 75% ක් රජය විසින් දරනු ලැබේ.) |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය | මූල්‍ය ප්‍රවේශ මගින් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නගා සිටුවීම හා සංවර්ධනය. | "දිරි සවිය", "ජය ඉසුර", "ඇරඹුම", "හරිත ණය", සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සමාගම් පිහිටුවීම, "පවිත්‍ර ගංගා" වැනි සහනදායී ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජුනි 2017 | "දිරි සවිය" - කුකුළු මස් නිෂ්පාදකයින්, ස්වයං රැකියාලාභීන් හා සත්ත්ව පාලනයේ නියුතු ව්‍යවසායකයින් සඳහා ණය දෙනු ලැබේ. උපරිම ණය මුදල රු. මිලියන 5 ක් වන අතර 6.93% ක වාර්ෂික පොලියක් අය කෙරේ. වසර 7 ක් තුළ මෙම ණය ආපසු ගෙවිය යුතු අතර ඒ සඳහා වසරක සහන කාලයක් ලබා දේ. (පොලියෙන් 50% ක් රජය විසින් දරනු ලැබේ.) |
| | | | | ජුනි 2017 | "ජය ඉසුර" - කෘෂිකාර්මික, ධීවර, විසිතුරු මත්ස්‍ය වගාව, පශුසම්පත්, විසිතුරු මල් වගාව, ගෙවතු වගාව, ලුහු ඉංජිනේරු, මුද්‍රණ, සංචාරක, අත්කම්, දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත, තොරතුරු තාක්ෂණ, නිෂ්පාදන කර්මාන්ත සහ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයන්හි නියැලෙන සුළු මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය ලබා දීම. උපරිම ණය මුදල රු. මිලියන 400 ක් වන අතර 6.93% ක් (සුළු ව්‍යවසායකයින්) හෝ 10.4% (මධ්‍ය ව්‍යවසායකයින්) පොලී අනුපාතයක් යටතේ වසරක සහන කාලයක් ඇතුළත්ව වසර 07 කින් ගෙවිය යුතුය. (සුළු හා මධ්‍ය පරිමාණ යන පදනම් මත 50% හෝ 25% පොලී සහනාධාරයක් රජය මඟින් ගෙවනු ඇත.) |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| | | | | ජූනි 2018 | "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය තරුණ උපාධිධාරීන් හා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5, 6 හා 7 මට්ටමේ සහතිකපත්ලාභීන් හට රු. මිලියන 1.5 ක උපරිම ණය මුදලක් වසර 2 ක සහන කාලයක් ද ඇතුළත්ව, වසර 7 කින් ආපසු ගෙවීමේ පදනම මත ලබා දෙනු ලැබේ. (100% සහනධායී ණය පොලි අනුපාතය රජය විසින් දරනු ලබයි.) |
| | | | | ජූනි 2017 | "හරිත ණය" - අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිෂ්පාදනය කරන්නන්, කුඩා පරිමාණ හෝටල් හිමියන් සහ කාබනික පොහොර නිපදවන්නන් හා සංචාරකයින් සඳහා සංචාරක සත්කාරක නිවාස පවත්වාගෙන යන්නන් සඳහා පිළිවෙලින් රු. මිලියන 1 ක් හා රු. මිලියන 5 ක් වසරකට 6.93% ක පොලී අනුපාතයක් යටතේ වසරක සහන කාලයක් ඇතුළත්ව වසර 10 කින් ගෙවිය යුතු පරිදි ලබා දෙනු ලැබේ. (50% ක පොලී සහනාධාරයක් රජය මඟින් ගෙවනු ඇත.) |
| | | | | ජූනි 2016 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ණය - මෙම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ණය යටතේ සියළුම අංශවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය ප්‍රදානය කරනු ලබයි. උපරිම ණය මුදල රු. මිලියන 50 ක් වන අතර වසරකට සියයට 11 - 14 දක්වා පොලී අනුපාතයක් යටතේ මෙම ණය වසර 2 ක සහන කාලයක් ඇතුළත්ව වසර 10 කින් ගෙවිය යුතුය වේ. (ආසියානු සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍යානය කරනු ලබයි.) |
| | | | | ජූනි 2017 | සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් පිහිටුවීම - තරුණ තරුණියන්, කාන්තාවන්, ගොවීන් හා සුළු පරිමාණ සමාගම් පිහිටුවීමට කැමති පුද්ගලයින් සඳහා ණය ලබා දීම. උපරිම ණය මුදල රු. මිලියන 10 කි. මාසික ණය වාරිකයෙන් 75% ක් රජය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ සමාගම් වෙත ගෙවනු ලබයි. අදාළ සමාගම් බහුතර සාමාජිකයන් කාන්තාවන් නම් මාසික ණය වාරිකයෙන් 85% ක් රජය විසින් දරනු ලැබේ. තවද, සමාගමේ සාමාජිකයන්ගෙන් බහුතරයක් සුවිශේෂී හැකියා සහිත පුද්ගලයන් නම් මාසික වාරිකයෙන් 90% ක් රජය මඟින් ගෙවනු ලබයි. |
| | | | | ජූනි 2017 | "පවිත්‍ර ගංගා" - දැනටමත් කැළණි ගඟට හා කලපුවලට අපද්‍රව්‍ය බැහැර කරන සමාගම් සඳහා ණය ප්‍රදානය කරනු ලබයි. උපරිම ණය මුදල රු. මිලියන 30 ක් වන අතර වාර්ෂිකව 6.5% පොලී අනුපාතයක් යටතේ වසර 02 ක සහන කාලයක් ඇතුළත්ව වසර 10 කින් ණය ගෙවිය යුතුය. |

| ක්ෂේත්‍රය | අරමුණ | ක්‍රියාත්මක මිණුම් | ක්‍රියාත්මක කිරීම | | විස්තර |
|---|---|---|---|---|---|
| | | | නියාමන ආයතනය | දිනය | |
| ප්‍රවාහන | සුව පහසු හා පරිසර හිතකාමී පොදු ප්‍රවාහනය හා ආරක්ෂාකාරී පාසල් ප්‍රවාහනය සඳහා පහසුකම් සැලසීම. | "රිය ශක්ති" සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජුනි 2017 | "රිය ශක්ති" - පාසල් ළමුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ හිමියන්ට මෙමගින් සියයට 3.46 ණය පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 4.0 ක උපරිම ණය මුදලක් ලබා දෙනු ලබයි. (75% ක සහනදායී ණය පොලී අනුපාතය රජය විසින් දරනු ලබයි.) |
| පුනර්ජනනීය බලශක්ති | පරිසර හිතකාමී විකල්ප බලශක්ති ප්‍රභව සඳහා හුවමාරුවීම දිරිගැන්වීම. | "රිවි බල සවි" සහ වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන වැනි සහනදායී ණය යෝජනා ක්‍රම (RSPGLoC) හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජුනි 2017 | "රිවි බල සවි" - සූර්ය බල ශක්ති ඒකක සවි කිරීමට අපේක්ෂිත පෞද්ගලික නිවාස හිමියන් සඳහා උපරිම රු. 350,000 ක් 6.93% ක වාර්ෂික ණය පොලී අනුපාතයක් යටතේ වසර 5 කින් ගෙවීමේ පදනම මත ලබා දේ. (50% සහනදායී ණය පොලී අනුපාතයක් රජය විසින් දරනු ලබයි) |
| | | | | සැප් 2018 | වහලය මත සවිකරන ලද සූර්ය බලශක්ති උත්පාදන ණය යෝජනා ක්‍රමය - මෙමගින් පෞද්ගලික නිවාස හිමියන් සහ ව්‍යවසායකයින් වෙත කිලෝ වොට්ස් 50 ක උපරිම සූර්ය බලශක්තිය නිෂ්පාදනයක් සඳහා අවශ්‍ය මුළු මුදල වෙනුවෙන් ණය පහසුකම් 8% වාර්ෂික පොලී අනුපාතයක් යටතේ වසර 10 කින් ආපසු ගෙවීමේ පදනමින් ලබා දේ. හය මසක සහන කාල සීමාවකින් ණය ආපසු ගෙවීමට ලබා දේ. (ආසියානු සංවර්ධන බැංකුව ප්‍රතිමූල්‍යනය කරනු ලබයි.) |
| නිවාස | අඩු ආදායම්ලාභින් සඳහා නිවාස අවශ්‍යතා සපුරා ලීම. | "සොඳුරු පියස" සහනදායී ණය යෝජනා ක්‍රම හඳුන්වාදීම. | සංවර්ධන මූල්‍ය දෙපා. - මුදල් අමාත්‍යාංශය | ජුනි 2017 | "සොඳුරු පියස" - තම නිවසේ ඉදිකිරීම සම්පූර්ණ කිරීමට හෝ පවතින නිවස පුළුල් කිරීමට අපේක්ෂා කරන වර්ග අඩි 1,500 ට අඩු නිවාස හිමියන්ට මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදේ. උපරිම ණය සීමාව රු. 200,000 ක් වන අතර වාර්ෂික පොලී අනුපාතය 6.93% කි. මෙම ණය වසර 7 කින් ආපසු ගෙවිය යුතුය. (පොලී අනුපාතයෙන් 50% රජය විසින් දරනු ලැබේ.) |